රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 01/2014 (III)

මගේ අංකය: EST-2/POLCY/03/07100
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2016.05.16

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට සංශෝධන වශයෙන් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම විධිවිධාන අනුව අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව අත්කර ගැනීම සඳහා අදාළ ලිඛිත විභාගය සහ වාචික පරීක්ෂණය 2016 වසරේ සිට වසරකට දෙවරක් පැවැත්වීම සඳහා වූ විධිවිධාන සකස් කළයුතු බවට 2015.12.16 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

03. ඒ අනුව පළමුවන ඡේදයේ සඳහන් චක්‍රලේඛයේ විධිවිධාන අනුව අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීමට අදාළව පැවැත්වෙන ලිඛිත විභාගය හා වාචික පරීක්ෂණය පහත සඳහන් පරිදි 2016 වර්ෂයේ සිට පැවැත්වීමට කටයුතු යොදා ඇති බැවින් ඒ පිළිබඳව ඔබ ආයතනයේ නිලධරයන් දැනුම්වත් කරන මෙන් දන්වා සිටිමි.

**04. අනෙක් රාජ්‍ය භාෂා ලිඛිත විභාගය**

04.1 රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ www.languagesdept.gov.lk වෙබ් අඩවිය ඔස්සේ පමණක් මෙම විභාගයට අයදුම් කළ යුතුය. වෙබ් අඩවියට පිවිසීමෙන් පසුව තිරයේ දිස්වන පියවර අනුගමනය කළයුතු අතර, විමසා ඇති කරුණු සඳහා වලංගු දත්ත ඇතුළත් කර ඇති අයදුම්කරුවන් පමණක් විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබනු ඇත. එක් අයදුම්කරුවෙකුට එක් වරක දී අයදුම් කළ හැක්කේ එක් භාෂාවක එක් මට්ටමකට පමණි. විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවෙකු නම්, ඒ පිළිබඳ විස්තර අයදුම්පත්‍රයේ ඇතුළත් කළ යුතුය. (ආදර්ශ අයදුම්පත්‍රය - ඇමුණුම 01)

04.2 මින් ඉදිරියට මෙම විභාගයට අයදුම්පත්‍ර කැඳවීම සඳහා ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීමක් සිදු නොවන අතර, මෙම ලිඛිත විභාගය සඳහා අයදුම්කරුවන්ට අඛණ්ඩව අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය. එසේ ලැබෙන අයදුම්පත් අතරින් සෑම වසරකම ජනවාරි 31 දක්වා ලැබී ඇති අයදුම්පත් සඳහා මාර්තු මාසයේ ද, පෙබරවාරි 01 සිට ජූලි 31 දක්වා ලැබී ඇති අයදුම්පත් සඳහා සැප්තැම්බර් මාසයේ ද රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලිඛිත විභාගය පවත්වනු ලැබේ.

04.3 ලිඛිත විභාගයට පෙනී සිටීම සඳහා සෑම අයදුම්කරුවෙකුම රු.500.00ක විභාග ගාස්තුවක් ගෙවිය යුතුය. එම විභාග ගාස්තුව දිවයිනේ පිහිටි ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් "රාජගිරිය, ලංකා බැංකුවේ රාජ්‍ය භාෂා කොමසාරිස්ගේ අංක 7041541 දරන ගිණුමට" බැර කළයුතු අතර, එම පෝරමයේ තැන්පත්කරුගේ නම සහ ලිපිනය සඳහන් කිරීමට ඇති ස්ථානයේ නම සහ ලිපිනයට අමතරව අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය සමඟ Exam යන්න ද සඳහන් කර, මුදල් ගෙවීමෙන් පසුව බැංකුවෙන් ලබා දෙන ලදුපතෙහි පරිගණකය ආශ්‍රිතව මුද්‍රිත වී ඇති අංකය (කොටස් හතරකින් යුත්) හා දිනය රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ඇති අයදුම්පතේ අදාළ කොටුව තුළ සඳහන් කළ යුතුය.

04.3.1 සැළකිය යුතුයි - ඔබ විසින් අදාළ බැංකු ලදුපත විභාග ප්‍රවේශ පත්‍රය සමඟ අමුණා විභාගයේ දී ඉදිරිපත් කළ යුතුය.

04.4 විභාගය සමත් වීම සඳහා ලකුණු 40%කට නොඅඩුව ලබා ගත යුතු වේ. මෙම විභාගයේ පිළිතුරු පත් නැවත සමීක්ෂණය නොකෙරේ. එම විභාගවල ප්‍රතිඵල පිළිවෙළින් මැයි සහ නොවැම්බර් මාසවල දී ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය භාෂා කොමසාරිස් වෙත ලබා දෙනු ඇත. එසේම විභාග ප්‍රතිඵල ඒ ඒ අපේක්ෂකයන් වෙත පුද්ගලිකව දන්වා නොයැවෙන අතර, එය රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ www.languagesdept.gov.lk වෙබ් අඩවියේ පළ කරනු ලැබේ.

04.5 අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

04.6 විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණි. යම් හෙයකින් එසේ අනන්‍යතාව තහවුරු නොකොට ඉදිරිපත් වූ අපේක්ෂකයින්ගේ ප්‍රතිඵල නිකුත් කරනු ලබන්නේ ඒ පිළිබඳ විමර්ශනයක් සිදු කිරීමෙන් පසුව අනන්‍යතාව තහවුරු වන්නේ නම් පමණි.

04.7 විභාගය පැවැත්වීම හා විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත. මෙම ලිඛිත විභාගය සම්බන්ධයෙන්, ඉහත සඳහන් නොවන කරුණු පිළිබඳ අවසාන තීරණය ද අදාළ පරිදි විභාග කොමසාරිස් ජනරාල් හා/ හෝ රාජ්‍ය භාෂා කොමසාරිස් සතුය.

04.8 ලිඛිත විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

## 05. අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා වාචික පරීක්ෂණය

05.1 පහත සඳහන් ලිඛිත සුදුසුකම්වලින් එකක් හෝ සපුරා ඇති නිලධරයන් රාජ්‍ය භාෂා ප්‍රවීණතා වාචික පරීක්ෂණය සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ www.languagesdept.gov.lk වෙබ් අඩවිය ඔස්සේ අයදුම් කළ යුතුය.

1) අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලිඛිත විභාගය සමත්වීම.
2) අ.පො.ස.(සා.පෙළ) විභාගයේ සිංහල හෝ දෙමළ භාෂාව හා සාහිත්‍ය විෂය සමත්වීම.
3) අ.පො.ස.(සා.පෙළ) විභාගයේ සිංහල හෝ දෙමළ දෙවන බස විෂය සමත්වීම.

05.2 වසරේ ඕනෑම දිනක වාචික පරීක්ෂණය සඳහා අයදුම් කළ හැකි අතර, එසේ අයදුම් කිරීමේ දී ඉහත 04.1 ඡේදයේ උපදෙස් අනුගමනය කළ යුතුය. (ආදර්ශ අයදුම් පත්‍රය ඇමුණුම 02) මින් ඉදිරියට මෙම පරීක්ෂණයට අයදුම්පත්‍ර කැඳවීම සඳහා ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීමක් සිදු නොවේ.

05.3 වාචික පරීක්ෂණය සඳහා අයදුම් කරන සෑම නිලධරයෙකුම විභාග ගාස්තුවක් ගෙවිය යුතුය. එක් එක් මට්ටමට අදාළ විභාග ගාස්තු පහත පරිදි වේ.

| අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා මට්ටම | ගාස්තුව (රු.) |
|---|---|
| I මට්ටම | රු: 1000.00 |
| II මට්ටම | රු: 700.00 |
| III මට්ටම | රු: 500.00 |
| IV මට්ටම | රු: 300.00 |

05.4 විභාග ගාස්තුව දිවයිනේ පිහිටි ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් “රාජගිරිය, ලංකා බැංකුවේ රාජ්‍ය භාෂා කොමසාරිස්ගේ අංක 7041541 දරන ගිණුමට” බැර කළ යුතු අතර, එම පෝරමයේ තැන්පත්කරුගේ නම සහ ලිපිනය සඳහන් කිරීමට ඇති ස්ථානයේ නම සහ ලිපිනයට අමතරව තැන්පත්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය සමඟ Exam යන්න ද සඳහන් කර, මුදල් ගෙවීමෙන් පසුව බැංකුව විසින් ලබා දෙන ලදුපතෙහි පරිගණකය ආශ්‍රිතව මුද්‍රිත වී ඇති අංකය (කොටස් හතරකින් යුත්) හා දිනය රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ඇති අයදුම්පතේ අදාළ කොටුව තුළ සඳහන් කළ යුතුය. අදාළ මුදල ගෙවූ බව සහතික කර ගැනීම සඳහා බැංකු ලදුපත ශ්‍රවණ කුසලතා ඇගයීමට පැමිණීමේ දී අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතු වේ.

05.5 වාචික පරීක්ෂණය සඳහා අයදුම්පත් ලැබීමේ සංඛ්‍යාව මත වාචික පරීක්ෂණ පැවැත්වීමේ දින තීරණය කරනු ඇත. කෙසේ වුවද වාචික පරීක්ෂණ පැවැත්වෙන දින පිළිබඳව මසකට පෙර අයදුම්කරුවන් වෙත දැනුම් දීමට කටයුතු කරනු ඇත. මෙම පරීක්ෂණය ශ්‍රවණ කුසලතා ඇගයීම සහ කථන කුසලතා ඇගයීම වශයෙන් කොටස් 02කින් සමන්විත වේ. ශ්‍රවණ කුසලතා විභාගය සමත් අයදුම්කරුවන්ට පමණක් කථන කුසලතා ඇගයීමට අවස්ථාව ලබා දෙන බව අවධාරණය කෙරේ. සියලුම මට්ටම්වලට අදාළ ශ්‍රවණ කුසලතා ඇගයීමේ පරීක්ෂණ රාජගිරිය, කෝට්ටේ පාර, 341/7, "භාෂා මන්දිරය"හි පිහිටි රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දී පමණක් පවත්වනු ඇත. (මෙම ඇගයීම ද ඉදිරියේ දී පළාත් මට්ටමින් පැවැත්වීමට කටයුතු කරනු ඇත.) කථන කුසලතා ඇගයීම අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව සලකා දිස්ත්‍රික්ක/ පළාත් මට්ටමින් පවත්වනු ඇත. විභාගය සමත්වීම සඳහා එම කොටස් දෙකටම ලකුණු 40% නොඅඩුව ලබා ගත යුතුය. විභාග ප්‍රතිඵල ඒ ඒ අපේක්ෂකයන් වෙත දන්වනු ලබන අතර, එය රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ ද පළ කරනු ලැබේ. මෙම විභාග ප්‍රතිඵල නැවත සමීක්ෂණය සිදු නොකරන අතර, වාචික පරීක්ෂණ සම්බන්ධයෙන් වන සියලු කරුණු පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය භාෂා කොමසාරිස් සතු වේ.

06. මෙම චක්‍රලේඛයේ සඳහන් කරුණු පිළිබඳව යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම් 0112888929 අංකය ඔස්සේ රාජ්‍ය භාෂා කොමසාරිස් ඇමතිය හැකි අතර තනතුරට අදාළව නිලධරයන් විසින් ලබා ගත යුතු අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා මට්ටම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව තහවුරු කර ගත යුතුය.

ජේ.දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

ඇමුණුම I

රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලිඛිත විභාගය
සිංහල/දෙමළ (I, II, III, IV මට්ටම්)
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන දිස්ත්‍රික්කය (කැමැත්තේ අනුපිළිවෙළට) :*

- කැමති දිස්ත්‍රික්කය තෝරන්න 1 ▼ | - කැමති දිස්ත්‍රික්කය තෝරන්න 2 ▼ | - කැමති දිස්ත්‍රික්කය තෝරන්න 3 ▼

රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතු භාෂා මාධ්‍යය:*

- විභාග භාෂාව තෝරන්න - ▼

ඉල්ලුම් කරන මට්ටම: *

- විභාග මට්ටම තෝරන්න - ▼

සැ.යු. ප්‍රවීණතාව ලබා ගත යුතු භාෂාව හා ඉල්ලුම් කරන භාෂා මට්ටම නිවැරදිව ඇතුළත් කිරීම අනිවාර්ය වන අතර එය කිසිම හේතුවක් නිසා පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන් හෝ දෙමළෙන්):

(උදා : සමරසිංහ ආරච්චිගේ සමන් කුමාර සමරසිංහ/உதாரணம்: சமரசிங்ஹ ஆரச்சிகே சமன் குமார சமரசிங்ஹ)

අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්): *

(උදා:SAMARASINGHE ARARACHIGE SAMAN KUMARA SAMARASINGHE) *

මුලකුරු අගට යොදා අයදුම්කරුගේ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්): * (උදා:SAMARASINGHE, S.A.S.K) *

ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (ප්‍රවේශ පත්‍රය හා ප්‍රතිඵල ලේඛනය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) : *

සේවා ස්ථානය අයත් දිස්ත්‍රික්කය:*

- සේවය කරන ස්ථානයේ දිස්ත්‍රික්කය: - ▼

ජාතික හැඳුනුම්පත් අංකය:*

ස්ත්‍රී/පුරුෂ භාවය: *

- ස්ත්‍රී/පුරුෂ භාවය -

දුරකථන අංකය :*

+94

විද්‍යුත් තැපැල (ඊ-මේල් ලිපිනය): *

ස්ථිර තනතුර :

ඔබ විශේෂ අවශ්‍යතා සහිත නිලධාරියෙක්ද ? *

ඔව් නැත

01/2014 හෝ 04/2014 චක්‍රලේඛය අනුව ඔබ අයත් කාණ්ඩය : *

විභාග ගාස්තුව: රු:*

ගෙවූ බැංකු ශාඛාව :

පරිසනක මුද්‍රිත අංකය : * (උදා : 639/PF166654/1/19)

ගෙවූ දිනය : *

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත්, විභාග නීතිරීතිවලට යටත්වන බවත්, විභාගයට අදාල ඕනෑම කරුණක් සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වශයෙන් පිළිගන්නා බවත්, විභාගයට අදාල සියලු කොන්දේසි කියවා තේරුම්ගත් බවත් මා මෙයින් ප්‍රකාශ කරමි. *

එකඟවෙමි

තහවුරු කිරීමේ කේතය ඇතුලු කරන්න




Enter the characters as seen on the image above (case insensitive):

යොමුකරන්න

**රාජ්‍ය භාෂා ප්‍රවීණතා වාචික විභාගය**

**සිංහල/දෙමළ ( I, II, III, IV මට්ටම්)**

**රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව**

වාචික පරීක්ෂණයට ඉල්ලුම් කරනුයේ (අදාළ පේළිය තෝරන්න)

- (•) අ.පො.ස.(සා/පෙ) භාෂාව හා සාහිත්‍ය විෂයය සමත්වීම මත
- ( ) අ.පො.ස.(සා/පෙ) සිංහල/දෙමළ දෙවන බස සමත්වීම මත
- ( ) රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලිඛිත විභාගය සමත්වීම මත

වර්ෂය : [1980]

විභාග අංකය : [උදා : 1234567]

විෂයය : [උදා: Sinhala]

විෂයය අංකය : [උදා: 021]

වාචික පරීක්ෂණය සඳහා ඉදිරිපත්වීමට අපේක්ෂා කරන දිස්ත්‍රික්කය :*(කැමැත්තේ අනුපිළිවෙලට තෝරන්න)

[- Select Preferred District 1 -] [- Select Preferred District 2 -] [- Select Preferred District 3 -]

වාචික පරීක්ෂණය සඳහා පෙනී සිටින විෂයය:* (තෝරන්න)

[ ]

වාචික පරීක්ෂණයට පෙනී සිටින මට්ටම:* (තෝරන්න)

[ ]

අයදුම්කරුගේ සම්පූර්ණ නම :*(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(උදා :- SAMARASINGHE ARACHCHIGE SAMAN KUMARA SAMARASINGHE)

[ENTER FULL NAME]

මුලකුරු අගට යොදා අයදුම්කරුගේ නම :* (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (උදා :- SAMARASINGHE S. A. S. K.)

[ENTER NAME WITH INITIALS] [ ] [ ] [ ] [ ] [ ] [ ] [ ]

ස්ත්‍රී / පුරුෂ භාවය : * (තෝරන්න)

උපන් දිනය : *(තෝරන්න)

1980 1 20

ස්ථිර ලිපිනය ( ප්‍රවේශ පත්‍රය හා ප්‍රතිඵල ලේඛණය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) :*

ENTER YOUR ADDRESS

තැපැල් දිස්ත්‍රික්කය :* තැපැල් නගරය :* තැපැල් සංකේත අංකය:

- Select Postal District - - Select Postal City -

තනතුර :

ENTER YOUR JOB POSITION

ඔබ විශේෂ අවශ්‍යතා සහිත අපේක්ෂකයෙක්ද? :*(තෝරන්න)

ඔව් නැත

විභාග ගාස්තුව රුපියල් :*

ගෙවූ බැංකු ශාඛාව :*

පරිගණක මුද්‍රිත අංකය :*

ගෙවූ දිනය : *

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත්, විභාග නීතිරීතිවලට යටත්වන බවත්, විභාගයට අදාළ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වශයෙන් පිළිගන්නා බවත්, විභාගය සම්බන්ධ ගැසට් නිවේදනයේ සියලු කොන්දේසි කියවා තේරුම් ගත් බවත් මා මෙයින් ප්‍රකාශ කරමි.*

එකඟ වෙමි

තහවුරු කිරීමේ කේතය ඇතුළත් කරන්න




Enter the characters as seen on the image above (case insensitive):

යොමු කරන්න

## විභාග මධ්‍යස්ථානය පිහිටුවන දිස්ත්‍රික්ක/නගර හා දිස්ත්‍රික්ක අංක/නගර අංක

| පළාත | දිස්ත්‍රික්කය | දිස්ත්‍රික්ක අංකය |
|---|---|---|
| බස්නාහිර පළාත | කොළඹ | 1 |
| | ගම්පහ | 2 |
| | කළුතර | 3 |
| වයඹ පළාත | කුරුණෑගල | 4 |
| | පුත්තලම (හලාවත) | 5 |
| දකුණු පළාත | ගාල්ල | 6 |
| | මාතර | 7 |
| | හම්බන්තොට (තංගල්ල) | 8 |
| සබරගමු පළාත | රත්නපුර | 9 |
| | කෑගල්ල | 10 |
| ඌව පළාත | බදුල්ල | 11 |
| | මොණරාගල | 12 |
| මධ්‍යම පළාත | මහනුවර | 13 |
| | මාතලේ | 14 |
| | නුවර එළිය | 15 |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | 16 |
| | පොළොන්නරුව | 17 |
| උතුරු පළාත | යාපනය | 18 |
| | වවුනියාව | 19 |
| | මුලතිව් | 20 |
| | කිලිනොච්චිය | 21 |
| | මන්නාරම | 22 |
| නැගෙනහිර පළාත | ත්‍රිකුණාමලය | 23 |
| | මඩකලපුව | 24 |
| | අම්පාර | 25 |

இணைப்பு03

**பரீட்சை நிலையம் அமைந்துள்ள மாவட்டம் / நகரம் மற்றும்**
**மாவட்ட இலக்கம் / நகர இலக்கம்**

| மாகாணம் | மாவட்டம்/நகரம் | மாவட்ட இலக்கம்/ /நகர இலக்கம் |
|---|---|---|
| மேல் மாகாணம் | கொழும்பு<br>கம்பஹா<br>களுத்துறை | 1<br>2<br>3 |
| வடமேல் மாகாணம் | குருநாகல்<br>புத்தளம் (சிலாபம்) | 4<br>5 |
| தென் மாகாணம் | காலி<br>மாத்தறை<br>அம்பாந்தோட்டை (தங்கல்லை) | 6<br>7<br>8 |
| சப்பிரகமுவ மாகாணம் | இரத்தினபுரி<br>கேகாலை | 9<br>10 |
| ஊவா மாகாணம் | பதுளை<br>மொனராகலை | 11<br>12 |
| மத்திய மாகாணம் | கண்டி<br>மாத்தளை<br>நுவரெலியா | 13<br>14<br>15 |
| வட மாகாணம் | அனுராதபுரம்<br>பொலன்னறுவை | 16<br>17 |
| வட மாகாணம் | யாழ்ப்பாணம்<br>வவுனியா<br>முல்லைத்தீவு<br>கிளிநொச்சி<br>மன்னார் | 18<br>19<br>20<br>21<br>22 |
| கிழக்கு மாகாணம் | திருகோணமலை<br>மட்டக்களப்பு<br>அம்பாறை | 23<br>24<br>25 |